# 12 වන ජාතික නියෝජිත සමුළුවට ඉදිරිපත් වූ යෝජනා සැකෙවින් මෙසේය.

1. **දේශපාලන ගැති වෘත්තීය සමිති විසින් බැංකු පද්ධතියට, බැංකු සේවක ප්‍රජාවට හා අප සංගමයට සිදුකරන අනර්ථකාරී ක්‍රියාවන් පරාජය කිරීම.**

   දේශපාලන පක්ෂවලට සම්බන්ධ වෘත්තීය සමිති විසින් ලංකා බැංකු සේවක සංගමයේ සාමාජිකයින්ට සිදුකරන සියලු ආකාරයේ අනිසි බලපෑම්වලට එරෙහිව සියලු ශාඛා සංගම්වල සහභාගීත්වයෙන් සහ එකමුතුවෙන් යුතු දිගුකාලීන වැඩපිළිවෙලක අවශ්‍යතාවය අපි දකිමු. දේශපාලන ආශිර්වාදය සහිතව බැංකු සේවක ප්‍රජාවට මෙන්ම ඒ ඒ බැංකුවල පවතින විනය නීතිරීති හා ක්‍රියාපිළිවෙත්වලට ද අභියෝග කරමින් අනීතික දේශපාලන අතපෙවීම් සිදුකරන දේශපාලන වෘත්තීය සමිතිවල අනර්ථකාරී වැඩපිළිවෙල පරාජය කිරීමටත් එම අහිතකර තත්වයන් සියලු ශාඛා සංගම් හා බැංකු කරා පැතිරයාමේ අවදානම නැති කිරීමටත් මව් සංගම් නායකත්වය සමඟ සියලු ශාඛා සංගම් එක්ව එය පරාජය කිරීම සඳහා ගත හැකි සියලු පියවර ගතයුතුය.

2. **රාජ්‍ය බැංකුවලට නිසි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හා පවතින පිළිගත් ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීම, නව බඳවා ගැනීම්වල පුහුණු හා කොන්ත්‍රාත් කාලය වසර 2ට සීමා කිරීම.**

   සියලුම රාජ්‍ය බැංකුවලට සේවකයින් බඳවා ගැනීමේදී ඒ ඒ බැංකුවල ක්‍රියාත්මක නිසි බඳවාගැනීමේ ක්‍රමවේදයන් හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතුය. එම බඳවා ගැනීම් ආයතනයේ අවශ්‍යතාවය මත මිස දේශපාලනික අවශ්‍යතාවයන් මත සිදුනොවිය යුතු අතර, සියලු ආකාරයේ දේශපාලන අතපෙවීම්වලින් තොර නිසි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් තුළින් රටේ ඕනෑම පුරවැසියෙකුට රාජ්‍ය බැංකුවක රැකියාවක් ලබාගැනීමේ සම අයිතියක් ස්ථාපිත විය යුතුය.

   එසේ ස්ථිර සේවයට බඳවා ගන්නා පුහුණු මාණ්ඩලික සහකාර, සංවර්ධන සහායක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ආරක්ෂක සහායක සහ ආරක්ෂක නිලධාරී ශ්‍රේණියේ සේවකයින්ගේ පුහුණු හා කොන්ත්‍රාත් කාලය උපරිම වසර 2 කට සීමාකර ඉන් අනතුරුව එම සේවයේ ස්ථිර කළයුතුය. එසේම දැනට වසර 2 ක් ඉක්මවා සිටින රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවල සියලුම සේවකයින් ස්ථිර සේවයට අනුයුක්ත කර ගතයුතුය. බැංකුවල පාලනාධිකාරීන් එය ඉටු නොකරන්නේ නම් ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළැඹීමටත් එම ක්‍රියාමාර්ග වැඩ වර්ජනයක් දක්වා ඉදිරියට ගෙනයාමටත් අවශ්‍ය පියවර ගන්නා බව බැංකු පාලනාධිකාරීන් වෙත බලකර දන්වා සිටිය යුතුය.

3. **බැංකු, මූල්‍ය හා රක්ෂණ ව්‍යාපාරයන්හි සේවක ප්‍රජාව එක් කරමින් වෘත්තීය සමිති සම්මේලනයක් ලෙස සංවිධානගත කිරීම.**

   ''මූල්‍ය ව්‍යාපාර සම්බන්ධ තාක්ෂණික දියුණුව හේතුවෙන් හා එම තාක්ෂණය හඳුන්වාදෙන බාහිර ආයතන විසින් ශ්‍රී ලංකාවේ බැංකු ව්‍යාපාරය සීඝ්‍රයෙන් තමන් වෙත නතු කරගැනීම සමඟ දැනට බැංකු හා මූල්‍ය ව්‍යාපාර ක්ෂෙත්‍රය තුළ රැකියාවෙහි නියුතු දහස් ගණනක් වන ස්ථිර ශ්‍රමිකයින්ගේ වෘත්තීය සුරක්ෂිතභාවයට බරපතල අභියෝගයන් එල්ල කරමින් සිටී.

   මානව ශ්‍රමය වෙනුවට තාක්ෂණික සහය ලබාගනිමින් මෙම ව්‍යාපාරික ආයතන බැංකු ක්ෂෙත්‍රය තුළ ඉතා සූක්ෂම මෙන්ම අතිශය ප්‍රවේගකාරී වෙනස්කම් දැනටමත් සිදු කරමින් සිටී.

   මේ හේතුවෙන් බැංකු හා මූල්‍ය ව්‍යාපාර ක්ෂෙත්‍රයේ රැකියාවල නියුතු ශ්‍රමිකයින්ගේ අනාගතය සුරක්ෂිත කරනු වස් ලංකා බැංකු සේවක සංගමය විසින් නොපමාව ගතයුතු තීරණ හා ක්‍රියාමාර්ග සැළසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා බලතල සහිත විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කරන බවට යෝජනා ඒකමතිකව සම්මත කරන ලදී.

   ඒ සඳහා මූලික පියවරක් ලෙස බැංකු, මූල්‍ය හා රක්ෂණ ව්‍යාපාරයන්හි නියුතු සහෝදර සහෝදරියන් සඳහා ද වෘත්තීය සමිති ව්‍යාපාරය පුළුල් කරමින් වෘත්තීය සමිති සම්මේලනයක් ලෙස සංවිධානගත වී කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු ස්ථාපනය කළයුතුය.

4. **බැංකු ක්ෂේත්‍රය තුළ පවතින පරිපාලිත සමාගම්වල සේවක ප්‍රජාව ඒකාබද්ධ කරමින් වෘත්තීය සමිති සම්මේලනයක් පිහිටුවීම.**

බැංකු ක්ෂේත්‍රයේ සාම්ප්‍රදායික බැංකුකරුවාගේ වෘත්තීය සහ රැකියාවේ ස්වභාවය සීග්‍රයෙන් වෙනස්වෙමින් පවතියි. මුල් කාලයේදී සාමාන්‍ය බැංකුකරුවෙකු විසින් සිදුකරන ලද සාමාන්‍ය රාජකාරී කටයුතු, අදවන විට ශ්‍රම විභාජනය තීව්‍ර මට්ටමකට පැමිණීමේ හේතුවෙන් එම සේවාවම විශේෂිත වූ වෙනමම බාහිරස්ථ ආයතන හරහා ලබාගැනීමේ ප්‍රවණතාවයක් දක්වා වර්ධනය වී ඇත.

ඊට අමතරව බැංකු ද මූලික බැංකුකරණය හැරුණුවිට සමූහ ව්‍යාපාර ලෙස විවිධ වූ ක්ෂේත්‍ර කෙරෙහි ව්‍යාපාර කටයුතු විහිදුවමින් බහුවිධ සේවා සපයන ආයතන බවට පරිවර්තනය වීමත් සමඟ බැංකුකරුවන් එවැනි වූ ව්‍යාපාර සමූහයේ වෙනත් ආයතනවල සේවය සඳහා අන්තර්ග්‍රහණය කිරීමද සිදුවෙමින් පවතියි. තවද, ඉදිරිපත් වී තිබෙන කම්කරු නීති සංශෝධනයන් අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ, ඉදිරියේදී ස්ථිර සේවකයන් කියා කොටසක් තවදුරටත් පවත්වා ගැනීමේ අරමුණක් ආයතන පාලනාධිකාරියට නොමැති බවයි. මෙම තත්වය වෘත්තීය සමිති කේවල් කිරීම්වලදීද ඉතා අවාසි සහගත විය හැක.

එබැවින් සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසිද්ධිය වෙනුවෙන් පෙනීසිටින වෘත්තීය සමිතියක් ලෙස සංගමයේ ක්‍රියාකාරකම් තවදුරටත් ව්‍යාප්ත කරමින් අපගේ සාමාජිකත්වය ඉහත කී පාර්ශව වෙතද දිගුකිරීම සඳහා දැන් කාලය එළඹ ඇත. එම නිසා බැංකු කටයුතු හා සෘජුව සම්බන්ධ සමූහ ව්‍යාපාරවල පරිපාලිත සමාගම්වල සේවකයන් සඳහාද වැඩපිළිවෙලක් සැකසීම තුළ මෙම කීර්තිමත් වෘත්තීය සමිතියට යුගයේ අවශ්‍යතාවයන්ට අනුව වඩාත් ශක්තිමත් වූ පුළුල් සංවිධානයක් ගොඩනගා ගැනීමේ අවස්ථාව හිමිවන අතර, ඒ තුළින් අනාගත අභියෝග සාර්ථකව ජය ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඒ සඳහා පුළුල් වැඩපිළිවෙලක් ලෙස එවැනි පරිපාලිත සමාගම්වල වෘත්තීය සමිති හා සම්බන්ධව වෘත්තීය සමිති සම්මේලනයක් ලෙස සංවිධානගතවිය යුතුය.

5. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව බැංකු සේවිකාවන්හට මාතෘ නිවාඩු ලබා ගැනීමට කටයුතු කිරීම. පීතෘ නිවාඩු ස්ථාපිත කිරීම.**

වර්තමානයේ ක්‍රියාත්මක වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව උපදින සෑම දරුවෙකු වෙනුවෙන්ම රාජ්‍ය සේවකයින්ට හිමි ප්‍රසූත නිවාඩු දින 84 ට අමතරව අර්ධ වැටුප් සහිත නිවාඩු මාස 3 ක්ද, අනුමත වැටුප් රහිත නිවාඩු මාස 3 ක්ද ලබාගැනීමේ අයිතිය සියලුම රාජ්‍ය බැංකුවල ක්‍රියාත්මක කළයුතුය. එමෙන්ම පීතෘ නිවාඩු ද ලබාගැනීමට අවස්ථාව ලබාදිය යුතුය.

තවද සාප්පු හා කාර්යාල පනත මගින් මෙන්ම ප්‍රසූතිකාධාර පනත මගින් නියමකර ඇති දිනකට විවේක වේලාවල් 2 කදී උපරිම වශයෙන් පැය 2ක් දක්වා වසරක් ගෙවෙන තුරාවට ළදරුවා වෙනුවෙන් මව්කිරිදීමේ අවස්ථාව සහ අයිතිය මව් පදවිය ලත් සෑම සේවිකාවකටම රාජ්‍ය හෝ පෞද්ගලික බේදයකින් තොරව ස්ථාපිත විය යුතුය. එම අයිතිය ලබානොදෙන බැංකු හෝ බැංකු ශාඛා සම්බන්ධව පැමිණිලි කිරීමට කම්කරු කාර්යාලයේ වෙනම අංශයක් ස්ථාපිතකර ඇති හෙයින් ඒ සම්බන්ධව පැමිණිලි භාරගැනීමට ශාඛා සංගම් මට්ටමින් හෝ මව් සංගම් කාර්යාල මට්ටමින් වෙනම ඒකකයක් පිහිටුවිය යුතුය.

6. **නිවුන් දරු ප්‍රසූතියක දී මාතෘ දාරක දීමනාව රු. 7,500/= ට ඉහළ නැංවීම.**

දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නිවුන් දරුවන් ප්‍රසූත කරන අවස්ථාවකදී සංගමයේ සුභ සාධන යෝජනා ක්‍රමය යටතේ දැනට ගෙවන රු. 5,000/- ක මාතෘදාරක දීමනාව රු. 7,500/- දක්වා වැඩිකිරීමට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

7. **කාර්මික ආරවුලක දී විසඳුම් ලබාදීම වෙනුවට කම්කරු අයිතිය සඳහා වන ක්‍රියාමාර්ග අධිකරණ වාරණ මගින් වැලැක්වීමට එරෙහිව පුළුල් වැඩ පිළිවෙළක් ස්ථාපිත කිරීම.**

කාර්මික ආරවුලකදී බැංකුවල පාලනාධිකාරීන් විසින් ඉතා සූක්ෂම අයුරින් වෘත්තීය සමිතිවල වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීමේ අයිතියට සෘජුවම අභියෝග එල්ල කරන අවස්ථා වර්තමානයේ සුලභව දක්නට ඇත. සේවකයාගේ යහපත වෙනුවෙන්, සංගමයෙන් යුතුව වෘත්තීය සමිතියක් ලෙස සාකච්ඡාමය ප්‍රවේශයට ගරු කරමින් කටයුතු කළද පාලනාධිකාරිය ඊට සාධනීය ප්‍රතිචාර නොදක්වමින් සාකච්ඡාමය ප්‍රවේශයෙන් බැහැරවන අවස්ථාවලදී එම පාලනාධිකාරියට එරෙහිව වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට අවතීර්ණවීමට සංගමයට අයිතියක් ඇත. නමුත් එවැනි අවස්ථාවලදී පාලනාධිකාරීන් විසින් ගැටළුවලට විසඳුම් සෙවීම පසෙකලා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අඩපණ කිරීමට අධිකරණය මගින් වාරණ නියෝග ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. එමගින් සේවකයා සතු අයිතීන් මෙන්ම ගැටළුවලට විසඳුම් ලබාගැනීමේ අවස්ථාවද අහිමි වන අතර අධිකරණයේ වාරණයට මුවාවෙමින් පාලනාධිකාරිය විසින් අදාල සේවක ගැටළු විසඳීම උපක්‍රමශීලීව අතහැර දමයි.

වාරණයෙන් පසු තත්වයන් අධිකරණයට වාර්තා වීමක් සිදුනොවන අතර, ඒ සම්බන්ධයෙන් කම්කරු කාර්යාලයේ වගකිවයුතු අංශ නිසි අයුරින් දැනුවත් කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී තිබිය යුතුය. මේ සඳහා කම්කරුවන් වෙනුවෙන් ස්ථාපිත සියලු වෘත්තීය සමිති හා පොදු සංවිධාන දැනුවත් කිරීමට සංගමය කටයුතු කළයුතු අතර, ඉදිරියේදී මේ සම්බන්ධව සාධාරණ හා මධ්‍යස්ථ ක්‍රියා පිළිවෙතක් ස්ථාපිත කරගැනීම වෙනුවෙන් පුළුල් වෘත්තීය සමිති සන්ධානයක් ගොඩනඟා ගත යුතුය.

8. **බැංකුවල පවත්වාගෙන යන විශ්‍රාම භාර අරමුදල් වැනි සුභසාධක අරමුදල්වලින් රජය දැනට අයකරන බදු මුළුමනින්ම ඉවත් කිරීම.**

රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවල සේවක සුභසාධනය වෙනුවෙන් එම බැංකුවල සාමාජිකයින්ගේ දායකත්වයෙන් සහ ආයතනයේ දායකත්වයෙන් අරඹා ඇති විශ්‍රාම නඩත්තු අරමුදල්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වෛද්‍යාධාර අරමුදල් වැනි, සේවක සුභසාධන චේතනාවන් පෙරදැරි කරගෙන අරඹා ඇති අරමුදල්වලින් දැනට රජය විසින් අයකරන සියලුම ආකාරයේ බදු ඉවත්කර එම අරමුදල්වල ප්‍රතිලාභ අදාල සේවකයන් වෙතම හිමිකර දිය යුතුය. ඒ අනුව බැංකුවල පවත්වාගෙන යන සියලුම ආකාරයේ සුභසාධන අරමුදල්වලින් රජය දැනට අයකරන බදු මුළුමනින්ම ඉවත් කළයුතුය.

9. **සියලුම බැංකුවල පවත්වාගෙන යන විනය පරීක්ෂණවල විධිමත් භාවය සම්බන්ධයෙන් කිසියම් පිළිගත් නියාමනයන් හා නිසි ක්‍රමවේදයන් ඇති කිරීමට කටයුතු කිරීම.**

සේවකයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ ඒ බැංකුවල ස්ථාපිතව පවතින විනය හා ආචාරධර්ම පද්ධතිය හෝ ආයතන සංග්‍රහයේ සඳහන් කරුණු පූර්වාදර්ශයන් කරගැනේ. නමුත් වර්තමානයේදී ඇතැම් රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවල ක්‍රියාත්මක විනය ක්‍රියාමාර්ග හා විනය පරීක්ෂණවල දැඩි ඒකපාර්ශවීය බවක් දක්නට තිබේ.

විශේෂයෙන් විනය පරීක්ෂණවලදී සමහර රාජ්‍ය බැංකුවල පාලනාධිකාරිය සේවකයින්ට එරෙහිව පවත්වනු ලබන විනය පරීක්ෂණවලදී සිය පරීක්ෂණ නිලධාරීන් ලෙස තෝරාගන්නේ එම බැංකුවේම සේවයකර විශ්‍රාම ගිය කළමනාකාරීත්වය නියෝජනය කරන නිලධාරීන් වන හෙයින් ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳව බරපතල ගැටළු ගණනාවක් මතුව තිබේ.

එසේම විනය කටයුතු අරභයා පාලනාධිකාරිය විසින් එම බැංකුවල පවතින ආචාර ධර්මයන්ට හා ආයතන සංග්‍රහයේ පවතින නිර්ණායකයන්ට අවනතවීමක් කිසිසේත්ම සිදුනොකරන අතර, ප්‍රශ්නගත සිද්ධියට සෘජුව සම්බන්ධ නොවන ද්විත්ව පාලන ක්‍රමවේදයන් නිසා එම සිද්ධියට සම්බන්ධවන නිලධාරීන්ද අසීමිත කාල ප්‍රමාදයන් සිදුකරමින් ඔවුනට හිමි වරප්‍රසාදයන් පවා අහිමි කිරීමට කටයුතු කර ඇත. සිදුවන මෙවැනි කාල ප්‍රමාදයන් තුළ සේවය අත්හිටුවා ඇති සේවකයින්ට අර්ධ වැටුප් හෝ දීමනා ඉල්ලා සිටීමේ නෛතික ප්‍රතිපාදනයන් ආයතන සංග්‍රහය තුළත් ඒ ඒ බැංකුවල ඇති විනය අත්පොත්වලද සඳහන්කර තිබුණද එම අයිතිය බොහෝ අවස්ථාවලදී ඉතා අමානුෂීය අන්දමින් අහිමිකර තිබේ. තවද සමහර බැංකුවල ප්‍රශ්නගත සිද්ධීන් සම්බන්ධව විනය පරීක්ෂණවලට සම්බන්ධ දැනට සේවයේ සිටින සේවකයින්ට හිමිවිය යුතු ප්‍රසාද දීමනා පවා අහිමිකර ඇත. මෙම අනවශ්‍ය කාල ප්‍රමාදයන් තුළ සේවකයා තවදුරටත් අසරණභාවයට පත්වන අතර, ඔහු හෝ ඇය ලබාගෙන ඇති මාණ්ඩලික ණය පවා අක්‍රිය අංශයට මාරුවීම හෝ ණය තොරතුරු කාර්යංශයේ වාර්තාවීම සිදුවන නිසා කිසිදු ගැලවීමක් නොමැත.

කිසියම් සේවකයෙක් අතින් හිතාමතා හෝ අත්වැරදීමකින් විනය විරෝධී ක්‍රියාවක් සිදුවූ විට ඒ සම්බන්ධ විනය ක්‍රියාමාර්ගයන් සාධාරණ කාලසීමාවක් තුළ පවත්වා නිශ්චිත හා සාධාරණ විනය තීන්දුවක් ලබාදී එම සේවකයාගේ වෘත්තීය අභිමානය ආරක්ෂා කරදිය යුතුය. ආයතන සංග්‍රහය තුළත් බැංකුවල විනය අත්පොත්වලත් ඇත්තේ සේවකයා යහමඟට ගැනීම පිණිස දඬුවම් නියම කිරීම මිස එම සේවකයාව කීපවරක් මරා දමා අවසානයේදී පෙට්ටියටද ඇණ ගසා මිහිදන් කිරීමටද කටයුතු සම්පාදනය කිරීම නොවන බව අවධාරණය කර සිටිමු.

එබැවින් දැනට ඉතිරිව ඇති (Pending) සියලු රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවල ක්‍රියාත්මක විනය පරීක්ෂණ පිළිබඳව විධිමත් අයුරින් තොරතුරු ලබාගෙන පිළිගත හැකි සාධාරණ හේතූන් නොමැතිව විනය පරීක්ෂණ මේ දක්වා පවත්වා නොමැති වසරකට වඩා පමාකර ඇති සියලුම විනය පරීක්ෂණ හා ක්‍රියාදාමයන්වලින් අදාල සේවකයින්ව නිදොස් කොට නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඒ ඒ බැංකුවල පාලනාධිකාරීන් වෙත බලකර සිටිය යුතු බවට යෝජනා ඒකමතිකව සම්මත කරන ලදී.
එසේම සියලුම බැංකුවල පවත්වාගෙන යන විනය පරීක්ෂණවල විධිමත්භාවය සම්බන්ධයෙන් කිසියම් පිළිගත් නියාමනයක් සහ නිසි ක්‍රමවේදයක් ඇති කිරීමට හැකිවන පරිදි කම්කරු කාර්යාලයේ වගකිවයුතු නිලධාරීන් ඒ සඳහා යොමු කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බැලීමට මව් සංගමය වෙත අවශ්‍ය බලය පැවරිය යුතුය.

10. **කම්කරු අණපනත්, රාජ්‍ය පාලන අවශ්‍යතාව වෙනුවෙන් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට එරෙහිව පුළුල් වෘත්තීය සමිති සංවිධානයක් ගොඩනැගීම.**

කම්කරුවාට රැකවරණය සලසන අණපනත් 54 ක් ඉවත දමමින් ඒකීය කම්කරු නීති මාලාවක් ක්‍රියාත්මක කිරීමට පසුගිය රජය උත්සාහ කළ අතර ඒ තුළ මෙතෙක් පැවැති කම්කරු අයිතිවාසිකම් ගණනාවක් අහෝසි කිරීමට හා හැකිලීමට නියමිතව තිබිණි. ලංකා බැංකු සේවක සංගමය ඇතුළු ස්වාධීන වෘත්තීය සමිති ගණනාවක් ඊට විරුද්ධව පෙළගැසුණු අතර, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

එසේම නව ආණ්ඩුව බලයට පත්වූ පසුවද එම ක්‍රියාමාර්ගවල පැහැදිලි වෙනසක් තිබේදැයි සැක සහිතය. ජාතික බුද්ධි පනත නමින් නව පණතක් ගෙනඒමට වත්මන් ආණ්ඩුව කටයුතු කරමින් සිටින අතර, එහිද වැඩකරන ජනතාවට අහිතකර වූ නීති ගණනාවක් පවතින බවට වෘත්තීය සංගම් විසින් හඳුනාගෙන ඇත.

එබැවින් කම්කරුවාගේ සුරක්ෂිත බව වෙනුවෙන් පවතින කම්කරු අණපනත් පාලකයාගේ අවශ්‍යතාවය වෙනුවෙන් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට එරෙහිව පුළුල් වෘත්තීය සමිති සන්ධානයක් ගොඩනගා ගනිමින් එක්ව හඬ නැගිය යුතු බවටත් කම්කරු අණපනත් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය මූලිකත්වය ගෙන කටයුතු කළ යුතුය.

11. **ගෝලීය උෂ්ණත්වය ඉහළ නැංවීමට රුකුල් දෙන තාක්ෂණික මෙවලම් සම්බන්ධව පිළිගත් නියාමනයන් ක්‍රියාත්මක කිරීමට රජයට බලකර සිටීම.**

ගෝලීය උෂ්ණත්වය දිනෙන් දින ඉහළ යමින් පවතින අතර, පසුගිය මාස කිහිපය තුළ කොළඹ හා තදාසන්න ප්‍රදේශවල උෂ්ණත්වය සෙල්සියස් අංශක 38$^{0}$C ඉක්මවා ගොස් තිබිණි. දිනෙන් දින සිදුවන අසීමිත වන සංහාරයට පිලියම් වශයෙන් තැන් තැන්වල ප්‍රසිද්ධිය පිණිස රෝපණය වන ගස්වැල් වලින් දිගුකලක් ප්‍රයෝජනයක් ලබාගත හැක්කේ එම වැඩසටහන් නොනවත්වා පවත්වාගෙන යමින් තීව්‍ර කිරීමක් මගින් හා නිවැරදි පසුවිපරමක් මගින් පමණි. බොහෝවිට සිදුවන්නේ පැල සිටුවීම පමණක් මිස ඒවා නිසිපරිදි අඛණ්ඩව පෝෂණය කිරීමක් හෝ නඩත්තු කිරීමක් නොවේ.

එසේම ගෝලීය උෂ්ණත්වය ඉහල නැංවීමට රුකුල් දෙන තාක්ෂණික මෙවලම් සම්බන්ධවද කිසියම් පිළිගත් නියාමනයන් ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා දිගුකාලීන ක්‍රියාමාර්ග ගැනීම පිණිස ලංකා බැංකු සේවක සංගමය රජයට බලකරමින් කටයුතු කළයුතුය.

12. **ඖෂධ මාෆියාව තුරන්කර රටතුළ පිළිගත් ඖෂධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලෙස රජයට බලකර සිටීම.**

ඖෂධ මාෆියාව නැති කරන ලෙස හා රටේ පිළිගත් ඖෂධ ප්‍රතිපත්තියන් ක්‍රියාත්මක කරන ලෙසට රජයට බලකිරීම සිදුකළ යුතුය. විශේෂයෙන් අසරණ පිළිකා රෝගීන් ඇතුළු ආසාධිත රෝගීන් වෙනුවෙන් ලබාදෙන අත්‍යවශ්‍ය ඖෂධ හා වේදනා නාශක රජයේ වියදමින් වහා රජයේ රෝහල් මාර්ගයෙන් රෝගීන් වෙත ලබාදීමට සුදුසු වැඩපිළිවෙලක් දියත් කිරීම සම්බන්ධයෙන් සංගමයේ අවධානය යොමුකර සිටිය යුතුය.

13. **රට තුළ දියර කිරි භාවිතය වැඩි කිරීම පිණිස ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට රජයට බලකර සිටීම.**

රට තුළ දියර කිරි භාවිතය වැඩිකිරීම පිණිස දේශීය කිරි ගොවියා නගා සිටුවීමට හැකි ක්‍රමවේදයන් සම්බන්ධයෙන් රජයට බලකර සිටිය යුතුය. විශේෂයෙන් බහු ජාතික කිරිපිටි සමාගම්වලින් දේශීය කිරි ගොවියාගේ නිෂ්පාදිතය බේරාගෙන එය රටේ ජනතාව වෙත ලබාදිය හැකි ක්‍රමවේදයක් සොයාගත යුතුය. එසේම කිරිපිටි භාවිතය වෙනුවට කොළ කැඳ වැනි ඖෂධීය පානයන් විශේෂයෙන් පාසැල් දරුවන් තුළ ප්‍රචලිත කිරීම වෙනුවෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට රජයට බලකළ යුතුය.

14. **සණස සංවර්ධන බැංකුව සමුපකාරික අරමුණු අනුව ගොඩනගමින් ශක්තිමත් සමුපකාර ව්‍යාපාරයක් ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා රටේ ප්‍රමුඛ සමුපකාර සංවර්ධන බැංකුව බවට පත්කිරීම.**

ශ්‍රී ලංකාව තුළ පවතින බැංකු සංඛ්‍යාව තවදුරටත් ඉහළ දැමීම නොකල යුතු බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවස්ථා කිහිපයකදී මඟපෙන්වීම් ලබාදී ඇත. මෑතකදී ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ 2020 මාර්ගෝපදේශකයේද මෙම කරුණ අවධාරණය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින විශේෂ බලපත්‍රලාභී බැංකු පහෙන් සමුපකාරික ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගත් එකම විශේෂ බලපත්‍රලාභී බැංකුව සණස සංවර්ධන බැංකුවයි.

රජයේ ආර්ථික වැඩපිළිවෙල තුළ සමූපකාරික පදනමක් ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට කටයුතු කරන වටපිටාවකදී එයට දායකවීම උදෙසා සණස සංවර්ධන බැංකුව මත පැවරෙන වගකීම අතිමහත් බවට යෝජනා ඒකමතිකව සම්මත කරන ලදී.

සණස සංවර්ධන බැංකුවේ හිමිකාරීත්වය සමූපකාර ව්‍යාපාරය තුළම රඳවා තබාගත යුතු බවත් ඒ හරහා ශක්තිමත් සමූපකාර ව්‍යාපාරයක් ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ පාදම ගොඩනැගිය යුතුය.

15. **බැඳුම්කර වංචාව හරහා EPF හා ETF අරමුදල්වලට සිදුව ඇති මූල්‍ය අලාභයන් තක්සේරුකර ඒවා රජයෙන් හෝ මහ බැංකුවෙන් අයකර ගැනීමට මැදිහත්වීම.**

ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදුවී ඇතැයි පැවසෙන බැඳුම්කර වංචාව පිළිබඳව නිකුත් වී ඇති වෝහාරික විගණන වාර්තාව අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සිදුවී ඇති මූල්‍ය අලාභයන් පිළිබඳව තක්සේරු කර එම අලාභයන් ශ්‍රී ලංකා රජයෙන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අයකර ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීමට කටයුතු කිරීම සුදුසු බවටත්, මෙය වැඩ කරන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය විසින් ඉටුකළයුතු යුගයේ කාර්යභාරයක් වන බැවින් ඒ සඳහා සංගමය වහා මැදිහත්විය යුතුය.